# සෙබළ සිතුවිලි දෙසතිය

2025
සැප්තැම්බර්
15 - 30

වෙළුම
L

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශණයකි






# ජීවිතය

සඳ රේඛා මැකී ගියා
නෙළුම් මලේ සුවඳ නැහැ
කඳුළු ගඟේ පාවීලා
දැන් මට මම නැති පාටයි.

සිහිනයකත් තනිකමක්
හිනාවකත් වේදනාවක්
ජීවිතයම අඳුර ගෙන
අතීතයක් නැති පාටයි.

අඳුරු වළාවක් සේ
මහ පොළොවට වැටෙන තුරා
තනිකමින් පාවීලා
දැන් මට මම නැති පාටයි.

කොප්‍රල් ඉසුර මධුසංඛ ඩබ්ලිව්කේ
12 ගැහේබ



# ඔච්චරයි උඹ නමින්

දැක්කොත් කර මාලයක්
පොල් වල්ලක් පිං කැටයක්
ගෙවල් බිඳියි,
ගුටි කයි නෑ නිමක්
මොනවද අයිසේ කී පාරක්ද
වයසත් 23යි,
ජීවිතෙන් භාගයයි
ගොඩ යන්න නම් තමුන්
පුනරුත්ථාපනය කළ හැකියි
කරන්නට හැකි ඔච්චරයි
උඹ නමින්.

කෝප්‍රල් කත්‍රිආරච්චි ටීඩීඑස්
8 ශ්‍රීලංපාහ



# පුංචි ආදරය

ලැබූ නොලැබූ
ඔබෙන් ලැබූ
ආදරය මා...

අසම්මත වූවත්
ජීවත්වෙමි තවම
නුඹ හින්දා


සැරයන් චතුර කුමාර පීජීඑච්
2(සෙච්) ශ්‍රීලයුවෙබ



# නුඹ

නුඹ දුටු
මුල් දින පටන්
හදේ ලැගුම් ගත් නමුදු
නුඹ මාගේ හදවතට
ළං වූයේ කෙදිනද?

ලාන්ස් කෝප්‍රල් බංණ්ඩාර ආර්එම්එන්
1ශ්‍රීලංරබ



# මුලකුර

ඉගිලෙන්නට අත්තටු නොමැතිවුවත්
සුළඟ දෙයි ඇති හැකි බලය
රුවල් ඔරුවක ගමන් මඟකට

මංජුසාවක් තුළ සැඟවුණ
දූම කේතුවක් ලෙසින් ඇවිත්
සංසාරයේ කෙදිනක හෝ
කලාාණ මිතුරෙකි මෙහි මුලකුර

**කෝප්‍රල් දුස්මන්ත එස්ඩීපී**
**6 ගැජේබ**

# සෙබළ සිතුවිලි

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශණයකි



ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය | www.army.lk | 011 2076967